

## යෝධයාගේ උයනේ සිරවූ බිරිඳ

**කපිල එම් ගමගේ**

කවුළුව සෙමෙන් විවර කර
සුළඟ එන පෙරමග බලයි
අඳුරේ නොදල්වා පහන
සඳ කිනිත්තක් අහසේ සොයයි

බලකොටුව උයනක්ද
කුරවි කෙවිල්ලන්ගෙන් අසයි
එල දරන්නේ කොහොම
තුරුලතා අතර හිඳිමින් සිතයි

මේ දන්න මල් සුවඳ හැර
තව තවත් සුවඳ මල් ඇතිද
සෙමෙන් පණනල හරින
පෙති හැලෙන මලක් සිඹිමින් සිතයි

වැහි බිඳක් වැටෙන විට
සුමුදු සියුමැලි දෝත පා
කඳුළු බිඳුවක හැඩරුව ඇතිද
උණුසුමින් තුරුලූ කරගෙන බලයි

වාළුකා කතරකට
වැසි වැටෙන සෘතුවක් නැතිද
කැලැන්ඩර් පිටු අතර
ඉලක්කම්, මාස ගණිමින් සොයයි

දෙපා මිරිකා හරින
තිත්ත වේදනා බර හිස දරයි
ගැඹුරු නින්දට වැටෙන ඔහු අතැර
හොරෙන් කඳුළකින් කවියක් ලියයි

පස් අතර කාලයක් මුල් අදින
වැටුණු තුරු පත් අතර පොහොර වන
ආදරේ පාට කොයි වගේදැයි
පාට නැති වලාකුලකින් අසයි

boondi.lk

## වැවේ වත්තෙ චෙරි ගහ

නදීරා මධුවන්ති රත්නායක

කරදියරැති ගිමන නිවන
තුරුළෙහි මා, නිබඳ රැඳෙන
වැවේ වත්තෙ බාල පුතේ
කියපන් නුඹ ගියේ කොතැන

අතු මත චෙරි පිරෙන දාට
හැම මල් කොළ වරන දාට
මා අසලම රැඳුණු පාද
අමතක කරනෙම්ද දාක

සුදු මල් පෙති හලා බඳෙන්
අතු ඉති හෙම නමා සැරෙන්
ගිය දා නුඹ හැඬුවා මම
මටත් හොරෙන් නික්ම ගමෙන්

සිදාදියට ගිය විගසින්
දෑස වැසුණු දූලි සැරෙන්
චෙරි ගහ ගැන මතකය නුඹ
කෙලෙසක හැලූවාද හදෙන්

ගෙඩි පළගන්නා කාලේ
ගේ ළඟ පොඩි ඉස්කෝලේ
පොඩි උන් නුඹ වගෙ බාලේ
ගැවසුණි පාමින් ආලේ

බර අතු හැම බිම හෙළමින්
උන් කළ නොමනා දඟ කම්
ඉවසූ හැටි මා කඳුළින්
අහපන් ලොකු අක්කාගෙන්

පුත නුඹෙ ආදර අම්මා
ඉවසනු බැරි මේ නිම්මා
දුක දැක පොරවක් නම්මා
පණ මා, සිඳලා දැම්මා

නැවත දිනෙක සිහිව මෙගම
සිදාදියෙන් පිටව ඇදෙන
නොදැක නුඹව තවත් වරෙක
මිලිනව යම් කෙලෙස මෙලෙස

සැඟවෙන්නෙමි නැගෙනු පිණිස
මේ වත්තෙම තැනෙක දිනෙක
අවසන් චෙරි ඵල විඳගත්
කුරුලෙකු ගේ වසුරු පිඩෙක

boondi.lk

## ගැටළු තැනක්

බඹරකොටුවේ සුධර්ම හිමි
1948

පිණිබිඳ සොයා එන ලා හිරු කිරණ    මෙනී
හිමිදිරි උදෙත් මොහු මගෙ අසපුවට    පනී
එම්බා සිසු දරුව සොමිනස් පිඩක    වැනී
සුරතල් කතාවෙන් නුඹ මගෙ දැණුම    මනී

පිළිසඳරෙහි යෙදී සිට ළිඳ ලඟ    දෙන්නා
නිරුවත් නිළඹරේ හිරු දිය යට    පෙන්නා
සේයාවේ රහස නුඹ හද තුල    ගන්නා
මතකයි පැය දෙකක් මා පිළිතුරු    දුන්නා

කාගෙද කතාවක් කන් සිදුරෙහි    ගෑමෙන්
හරකුන් කතා කල පුවතක්    පැවසීමෙන්
ලදැන් බැරි ඇයි ල කියා නුඹ විත්    විමසීමෙන්
පැය ගණනක් ගියා නිසි පිළිතුරු    දීමෙන්

සමනලයකුන් පෙන්නා අඹ මල්    ඉත්තේ
"කවුඩන් මොකොයි රොන් රස ඉරුමක්    නැත්තේ"
උඹ ඇසු මොහොත ඉඳගෙන පුටු අත    මත්තේ
දහ වද විඳීමෙනි පිළිතුරු    දීගත්තේ

නොවැටී කෙසේදැයි හිරු අහසෙහි    යන්නේ
දවසක් අසා විත් උඹ උකුලට    පැන්නේ
කොහොමද කියා මතකද පිළිතුරු    දුන්නේ
මා මිස වෙන කෙනෙක් නම් නැහැ    ගැලවෙන්නේ

ඇත්තට අපායම පිරුණෝ    ගින්නෙන්ද
එහෙනම් එහි සතුන් හැදුනේ    යකඩෙන්ද
පැහැදිලි කර දෙන්ට ගොස් මේ    බණ කන්ද
වරුවක් ගතවුනේ මට මොන    වදයෙන්ද

මහමෙර *පොලෝ කැරකුම * සහ    ඉර සේවේ
මේ හැම ගැනම මා නිසි පිළිතුරු    කීවේ
උඹ ඒ හැමවිටම සුරතලයකි    පෑවේ
මොනවා අහන්නද අද දුවගෙන    ආවේ

ඔක්කොම හාමුදුරුවරු ලක    අදහන්නේ
බුද්ධාගමද ? ආ( හරි පැනයකි    පැන්නේ
"ඔව්" "නෑ" දෙකෙන් එකකිය කිව    යුතු වන්නේ
මම ගල් වුනෙමි, කොහොමද පිළිතුරු    දෙන්නේ

## කරුවලේ

චන්ද්‍රසේන බදුගම



අම්මෙ මං හැංගිලා පිච්ච ගාලේ මෙතන
ඉන්න මානෙක ඉඳං හිමිං හූවක් කියන්
ගොරෝනව ඇහෙනවා තාත්තා නිදි හැඩයි
නංගීත් ඒ හඬට ඇහැරිලා අඬනවා

ඇතිලියේ අඩිය, උඩ බලාගෙන, ලිප ගාව
හැංගිලා ගින්දරත් හොදි ඉහිරිලා ලිපේ
බත් හැලිය කුඩු වෙලා හිනාවෙනවා අපිට
අතු ගාන්නත් බෑනි කොස්ස කැඩුනා නේද?

කොහු පාර දිගේ අපි තෙල් ගාල අතගාමු
නංගීට කිරි දීල නින්ද ගියැයිං පස්සෙ
තාත්තගෙ චෙරි හිඳිල ඇහැ ඇරෙනකං අපිත්
ඇහැ පියා ගමුද සංගුව පිඹින්නත් ළඟයි



## නාය ගිය කන්ද මිනිස්සුන්ට කියපු කවිය

**ජනිත් විතාරණගේ**

මගේ ඔළුවට උඩින් ඉර ඇවිත් කොඳුරලා
කියනකොට නැගිටපන් තේ පඳුරු පීදිලා
ලැයිම් කාමර ඇතුලෙ පැදුරු කඩ අකුලලා
නැගපු හැටි මතකයිද කකුල් දෙක අඩවලා

මගෙ ඉහ කෙස් කපා තේ පඳුරු හිටවලා
තැනින් තැන පේලියට ගල් වැටිය අතුරලා
ගිනි අවුවේ මැරීගෙන රුපියලක් ඇහිඳලා
කවනකොට පොඩි උන්ට මම ගියා ගැස්සිලා

කූඩැල්ලො උරනකොට ජීවිතේ එල්ලිලා
කහට දළු ගියපු හැටි පිට රටක ඉගිලිලා
ඉඳ හිටක දවසකට කෝවිලේ හඬ තලා
දුක් ගොඩක් කියනකොට මම ගියා වෙවුලලා

කලූපාට හම ඇතුලේ ලේ පිරුන පපුවලට
හැමදාම වැඩ කරල ගැට ගැහුණ අත පයට
නිදහසේ නිදියන්න දුක් වින්ද ඇස්වලට
ඉඩ දෙන්න මම ආවේ දිය වෙලා වැස්සකට

රිදුනොතින් සමාකර ඉවසපන් තන්ගම්මෙ
වඩිවේල් වත් ඉතිං එක්ක යමු මේ ගැම්මෙ
මාත් පොළවට හනික පාත් වෙන්නම් පිම්මෙ
බදාගෙන ආදරෙන් නිදිය ගමු දැන් අම්මෙ

boondi.lk




සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com